SINGALAM

# *The Spoken Word*

*by*

*WILLIAM MARRION BRANHAM*

## ප්‍රථම පාපය

## The Original Sin

ஏழாம் தூதன்

வில்லியம் மரியன் பிரன்ஹாம்

"உரைக்கப்பட்ட வார்த்தையே மூல வித்து"

# ප්‍රථම පාපය
# The Original Sin

ශු. ආත්මයාණන් වහන්සේගේ හඩ

එළිදරව් 2:7 ආත්මයාණන් වහන්සේ සභාවලට කියන දේ කන් ඇත්තන් අසාවා: ජය ගන්නාට දෙවියන් වහන්සේගේ පාරාදිසයෙහි තිබෙන ජීවන වෘක්ෂයෙන් කන්නට දෙන්නෙමි. ආත්මයාණන් වහන්සේ සභාවට කියන දේ කන් ඇත්තෝ අසත්වා. දහස් ගනන් අය මේ දේ කියවලා ඇති එසේ නොවෙයි නම් අසා ඇති. කී දෙනෙක් එය පිළිගත්තාදැයි අපට කිව නොහැකිය. සැබෑව දැනගැනීම අවශ්‍යයයි කියන්නා වූ පිපාසය ඇතුව වචනයට ඇහුම්කන් දෙන තැනැත්තාට ශු. ආත්මයාණන් වහන්සේ අර්ථය එළිදරව් කරන සේක. වචනයේ අර්ථය එළිදරව් කරනු ලබන්නේ ශු. ආත්මයාණන් වහන්සේ කරණ කොට ගෙනයි. අපි සැබෑව කොයි තරමට දේශනා කලත්, යමෙක් එය අසන පිණිස තමාගේ කන විවර කර, ඔහු විසින් එය පිළි නොගන්නවා නම් එම අර්ථය එළිදරව් නොවන්නේය. ආත්මායාණන් වහන්සේ සභාවලට කියන සේක යනු වචනය ඔහුගේ වචනයෙන් සඳහන් වී තිබෙනවා. බයිබලයේ පළමු පොත වන උත්පත්ති පොතේ පවසන ලද වචන බයිබලයේ තිබෙන අනිකුත් පොත්වල ස්ථිර කර ලබමින්, අවසාන පොත වන එළිදරව් පොතෙන් අවසන් වෙනවා වගේම, පළමු සභාව වන එපීස සභාවට ආත්මයාණන් වහන්සේ ලබා දෙන සැබෑව (ක්‍රියා පොතේ සැබෑව) ලවෝදික කාලය අවසානය දක්වා ලබා දුන්නා වූ සැබෑවම වේ. එක්, එක් සභාවේ කාලය දී ඉතාමත් ප්‍රවේශමෙන් සිටිය යුතුයි. මක්නිසාද පළමු සභාවේ නිකලොයි ආගමිකයින්ගේ ක්‍රියාවල්, හැම කාලවලදීත් වර්ධනය වී ලවෝදික සභාව කාලයේ දි මහත් ගසක් වන්නේය. එම කාලවල සිටින්නා වූ සැබෑවූ ඇදහිලිවන්තයන්ට ශු. ආත්මයාණන් වහන්සේ විසින් අවවාද කරනු ලබයි. අසන පිණිස කන් ඇත්තන් පමණයි ඇසුවේ.

# පොරොන්දුව

එළිදරව්ව 2:7 ජයගත්තවූ තම් දෙවියන් වහන්සේගේ පාරාදිසයේහි තිබෙන ජීවිත වෘක්ෂයෙන් කන්නට දෙන්නෙමි. ඔව්, යුද්ධය අවසන් වී අන්තිම හොරණෑ ශබ්දය ඇසුනායින් පසු, අපගේ ආයුධ බිම තැබුවායින් පසුව, ස්වාමීන් වහන්සේගේ පාරාදිසයේදි විවේක රැගෙන ජීව වෘක්ෂයේ නිතරම සහභාගිවෙමුව.

`ජීව වෘක්ෂය` යන වචනය උත්පත්ති පොතේ තුන් වතාවකුත් එළිදරව් පොතේ තුන් වතාවකුත් සඳහන් වී සියළුම තැන්වලදීත් එකම තේරුමක් ගෙන දෙන ආකාරයෙන් සටහන් වී ඇත.

`ජීව වාක්ෂය` යනු කුමක්ද? බාලාම් ඉස්රායෙල් ජනතාවට මෙසේ කියයි. ස්වාමීන් වහන්සේ සිටෙවූ අගරු ගස් මෙන්ද බයිබලයේ වෘක්ෂය යනු වචනයේ තේරුම මිනිසුන් පිළිබඳවයි. පළමු ගිතාවලියේ ස්වාමීන් වහන්සේට ප්‍රිය තැනැත්තා දිය ඇලි ළග හිඳවූ ගසකට සමාන කරනු ලබනවා. එසේ නම් ජීව වෘක්ෂය, ජීවනය ලබා දෙන්නා වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.

ඒදෙන් උයන මැද ජීවන වෘක්ෂය, යහපත් හා අයහපත් .. දැනගන්න පුළුවන් ගස් තිබුණේය. ජීව වෘක්පය කරණකොට ගෙන මනුෂ්‍යන් ජීවත් විය යුතුවත්, අනිකුත් ගසෙහි කන කල මරණය පැමිනෙන බව අගා පැමිනියා. මිනිසා විසින් ආශා කඩ කළ අවස්ථාවේදි මරණය පාපය කරණ කොට ගෙන පැමිණියේය. ඔහුව දෙවියන් වහන්සේගෙන් ඈත් කරනු ලැබුවාය.

ඒ දේන් උයනේ තිබුණා වූ ජීව වෘක්ෂය යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. යේසුස් වහන්සේ තමන් සදාකාලික මුල (Source) බව සඳහන් කළ සේක. ``ස්වර්ගයෙන් බැස ආවා වූ ජීවනදායක කෑම මමය. මේ කෑමෙන් කැවොත් ඔහු සදාකාලිකව ජීවත් වේ.`` (යොහන් 6`51) ආබ්‍රහම් ඉපදීමටත් පළමුවෙන් මම සිටිමි කී සේක. (යොහන් 8:58)

නමුත් මා දෙන වතුර බොන කවරෙකුට වුවත් කිසි කලෙක පිපාසයක් නොවන්නේය. මා ඔහුට දෙන වතුර ඔහු තුළ සදාකාලික ජීවනය නික්ම වන්නා වූ වතුර උල්පතක් වන්නේය. (යොහන් 4:14) උන්වහන්සේ ජීවනදායක රොටිය ජීවනමාන උල්පතකි. සදාකාලිකය, ජීව වෘක්ෂය ඒදේන් උයනේ මැද සිටිය ආකාරයෙන් දෙවියන් වහන්සේගේ පාරාදිස මැද උන්වහන්සේ සිටිනවා.

ඒදෙන් උයනේ මැද තිබුණේ ගස් යයි සමහරු තර්ක කරාවි. නමුත් ශු. ආත්මයාණන්ව ලැබූ අය එසේ නොකියයි. මන්ද ඔවුන් දන්නවා ඒ ගස් නොවන බව. `පොරොව ගස් මුල තබා තිබේ` (ලූක් 3:9) යයි යොහන් බව්තිස්ත දේශනා කළ අවස්තාවේ ඔහු සඳහන් කළේ වනාන්තරවල තිබෙන ගස් ගැන නොවේ. මිනිසුන් ගැනයි. දෙවියන් වහන්සේ අපට සදා කාලික ජීවනය ලබා දී තිබෙනවා. ඒ ජීවිතය ද පුත්‍රයාණන් තුළ බවයි. සාක්ෂිය (1 යොහන් 5:11) බව යොහන් තුමා පවසයි. නුඹලා ජීවනය ලබාන පිණිස මා ළඟට එන්න කැමති නැත. (යොහන් 5:40) යයි යේසුස් වහන්සේ යුදෙව්වරුන්ට කී සේක. පුත්‍රයාණන් ඇත්තාට ඒ ජීවනය ඇත. (යොහන් 5:12) බයිබලයේ සඳහන් කිසිම දෙයක් වෙනස් නොවන්නේය. ඒ සමඟ යමක් එකතු කරන්නවත් යමක් අහක් කරන්නවත් තහනම්. පුත්‍රයාණන් තුළ ජීවනය තිබෙන බව බයිබලයේ සඳහන් වී තිබෙනවා. එසේ නම් එදෙන් උයනේ තිබුනා වූ ජීව වෘක්ෂය යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.

`ජීව වෘක්ෂය` යම් මනුෂ්‍යයෙක් නම්, යහපත් අයහපත් යයි යන තේරුම ලබා දෙන ගහක් මනුෂ්‍යයක් විය යුතුයි. එය සාතන්ය. එසේ වී නම් ධර්මිෂ්ඨ වූ යේසුස් වහන්සේත් නපුරා වූ සාතන් කිට්ටුවෙන් සිටියේය. නුඹ (සාතන්) ස්වාමීන් වහන්සේගේ උයනක් වන ඒදෙන්හි සිටියේය. (එසකියෙල් 28:13) `සර්පයාගේ බීජ` පිළිබඳව පැහැදිලි එළිදරව්ව අපි මෙතෙක් ලබා ගත්තෙමුව. ඒදෙන් උයනේදී ඇත්තටම සිදු වූනේ කුමක්ද?. බයිබලයේ සඳහන් වන්නේ ඒවා සාතන් විසින් වංචා කරනු ලැබූ බවයි. සර්පයා විසින් ඒවා දූෂණය කළ ලැබුවා. සර්පයා වනාහි ස්වාමී වූ දෙවියන් වහන්සේ සෑදූ කවර තත්වයකට වඩා ප්‍රයෝග සහිත වූයේය (උත්පත්ති 3:1) කියා උත්පත්ති පොතේ සඳහන් වී තිබෙනවා. මෙම සත්වයාගේ ස්වභාවය (සර්පයාගේ) මනුෂ්‍යයාගේ ස්වභාවයට සමානව තිබුණේය. මනුෂයයෙක් වගේ කල්පනා කිරීමට සහ කථා කිරීමට හැකියාවක් ඔහු සතුව තිබුනේය. මනුෂ්‍යයා වඳුරන්ටත් (Chimpanzee) තිබුණා වූ රූපය ලබමින් කෙලින් ගමන් කිරීමට හැකියාව ද ඔහුට තිබූ බැවින් ස්ත්‍රී සමඟ මිශ්‍ර වී එම නිසා ස්ත්‍රී ගැබ් ගැනීමට හැකියාව තිබුණේය. ඒ ආකාරයෙන් ස්ත්‍රී දූෂණය කළ විට ස්වාමීන් වහන්සේ සර්පයාට ශාප කළ සේක. සර්පයාගේ ශරීරයේ සෑම කොටසක්ම වෙනස් කළ බැවින් ඉන් පසුව ඔහුට බඩගාගෙන යාමට සිදු වුනා. මනුෂයයා ප්‍රඥාවන්ත බැවින් ඔහුට පුළුවන් වුනා මනුෂයාටත් වඳුරන්ට තිබෙන සම්බන්ධතාවය සොයාගැනීමට.

එබැවින් වඳුරන්ගෙන් මනුෂ්‍යයා බිහි වූ බවට ඔප්පු කිරීමට උත්සාහ දරමින් සිටිනවා.නමුත් මනුෂ්‍යයාත් වඳුරාත් අතර තිබෙන සම්බන්ධතාවය (Missing Link) කිසි කලෙක සොයා ගැනීමට නොහැකි වන සේ දෙවියන් වහන්සේ කළ සේක.

මනුෂ්‍ය වර්ගයා බිහිවුනේ වඳුරාගෙන් නොවෙයි. නමුත් සතා මනුෂ්‍යයා සමඟ එකතු වුනා. ඒදෙන් උයනේදී සිදු වුනා වූ සිදුවීම මෙතෙක් සඟවා තිබුනා. දැන් අපට එළිදරව් වෙමින් පවතිනවා. මේ තුළින් ඒවා ජීවනය අහක් කොට මරණය ලබා ගත්තේය.

ඒදෙන් උයනේදී ස්වාමීන් වහන්සේ සර්පයාට කියපු දේ කුමක්ද ? තා සහ ස්ත්‍රිය අතරෙහි ද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නෙහියයි. කී සේක. (උත්පත්ති 3:15) මෙම වචනය කරණ කොට ගෙන ස්ත්‍රියකට බීජ ඇත්තේ යයි අපි තේරුම් ගත්තෙහි නම් , සර්පයාටත් බීජ තිබෙන බව පිළිගත යුතුව තිබෙනවා. ස්ත්‍රියකගේ බීජ මනුෂ්‍ය එකතුව නොමැතිව පිරිමි දරුවෙක් උපන්නේ නම් සර්පයාගේ බීජත් මනුෂ්‍යයාගේ සම්බන්ධතාවයක් නොමැතිව ඉපදුනා වූ පිරිමි දරුවෙක් විය යුතුයි. ස්ත්‍රියගේ බීජ ගැහැණු පිරිමි සම්බන්ධතාවයක් නොමැතිව ශු. ආත්මයාණන් කරණ කොට ගෙන ඉපදුනා වූ ක්‍රිස්තුස් වහන්සේ සැම කෙනෙක්ම දන්නවා. මේ වචනවල සර්පයාගේ බීජ කෙසේද මේ ලෝකේ බිහිවූනේ යන එළිදරව්වක් ලබා දෙන්නේ.

`ස්ත්‍රියකුගේ බීජ` යනු දෙවියන් වහන්සේ තමන් වහන්සේට මිනිස් වෙස් සාදාගත් හැටිත් මෙම පදවලින් දැන ගැනීමට හැකි වේ. ඒ ආකාරයෙන්ම `සර්පයාගේ බීජ` සාතන් මිනිසුන් අතරට කෙසේ ද ඇතුල් වුනේ යන දේත් සඳහන් වෙනවා. සාතන් දෙවියන් වහන්සේ විසින්ම මවන ලද ආත්ම බවින් දෙවියන් වහන්සේ මෙන් තමන්ට ශරීරයක් මවාගෙන මිනිසුන් අතරට පැමිණීමට නොහැක. එබැවින් මිනිසුන් සමඟ සම්බන්ධතාවයක් ඇති කිරීමට නම් කෙසේ හෝ තමාගේ බීජ මනුෂ්‍යයා තුළට ඇතුල් කිරීම ඔහුට අවශ්‍ය වෙනවා. මේ ආකාරයෙන් ඔහු කරන ජය ගත්තා වූ සිද්ධිය උත්පත්ති පොතේ සඳහන් වී තිබෙනවා. සාතන්ට සර්පයා යයි කියනු ලැබේ. සර්පයාගේ බීජ මනුෂ්‍යයා අතරට පැමිණියා යයි කියනවා නම් එහි තේරුම මනුෂ්‍යයා අතරට ඇතුල් වුනා යනුයි.

ආදම් ඒවාවල් හැඳින්වීමට පෙර සර්පයා ඇයව හැඳින් වූහ. ඒ තුළින් ලැබුවාවූ කෙනා කායින්, කායින් නපුරාගෙන් යයි යොහන් තුමා පවසයි. (1 යොහන් 3:12) ඔහු ආදම්ගේ පුත්‍රයා නම් ආදම් නපුරු කෙනෙක් විය යුතුයි. එසේ නම් කෙසේද ඔහුව දෙවියන් වහන්සේගේ පුත්‍රයා යයි කියන්නේ. (ලූක් 3:38) දේව වචනය ලබා දුන්නා වූ ශු. ආත්මයාණන් වහන්සේ කිසි කලක වෙනත් වචන ලබා නොදෙන්නේය. එබැවින් කායින් නපුරාගෙන් මේ ලොවට බිහි වුනා වූ කෙනෙක් තමාගේ පියාගේ ස්වභාවය අනුව ඔහු මිනී මරන්නෙක් වූයේය. සාතන් දෙවියන් වහන්සේට විරුද්ධ වුනාටත් වඩා ඔහුගේ පුතා වූ කායින් බොහෝ සේ දෙවියන් වහන්සේට විරුද්ධ වූ සේක.

කායින්වත් ඔහුගේ පූජාවත් දෙවියන් වහන්සේ පිළිනොගත්තේය. එවිට ඔහුගේ මුහුණ වෙනස් වූ සේක. තවද ස්වාමීන් වහන්සේ කායින් දෙස බලමින් නුඹේ සහෝදරයා වූ අබෙල් හොහෙදැයි කියා ඇසුවේය. එවිට ඔහු ද මා නොදන්නෙමි. මාගේ සහෝදරයාට මම මාගේ සහෝදරයාගේ රැකවලා දැයි කීය. ස්ත්‍රීයකගේ බීජය සර්පයාගේ ඉස පොඩි කරනු ලබයි යයි ස්වාමීන් වහන්සේගේ පොරොන්දුව, කුරුසියේ මරණය තුළින් සාතන්ව පරාජයට පත් කරමින් ක්‍රිස්තුස් වහන්සේ සම්පූර්ණ කළ සේක. කුරුසියේ සාතනගේ ඉස පොඩි කරනු ලැබුවේය. සාතන් විසින් යේසුස් වහන්සේගේ පාදය තද කරනු ලැබුවේය.

ස්ත්‍රීයකගේ බීජය මිනිසාගේ සම්බන්ධතාවය නොමැතිව කෙසේද මිනිස් වෙස් ලැබුනේ. ඒ බව බයිබලයෙ විස්තර කරයි. `සය වෙනි මාසයේ ගේබ්‍රියල් නම් දේව දූතයෙක් ගලීලයේ නසරේත් නුවර, දාවිත්ගේ පෙළපතේ යෝසෙප්ට නියම කරන ලද්දා වූ කන්තියා වෙතට ස්වාමීන් වහන්සේ විසින් යවනු ලැබුවේය. එම කන්‍යාවගේ නම මරියා. ඇය සිටියා වූ නිවසට දේව දූතයා ඇතුළු වී බොහෝ කරුණාව ලැබූ තැනැත්තිය ශුභ සිද්ධ වේවා. ස්වාමීන්වහන්සේ නුඹ සමග සිටින්නේ යැයි කීවේය. නමුත් අද ඔහුගේ කීමට බොහෝ සේ කැළඹී, මේ කෙබඳු වූ ආචාරයක් ද කියා කල්පනා කරමින් සිටියාය. දේව දූතයා ඇට කථා කොට `මරියා භය නොවන්න, මක්නිසාද නුඹට දෙවියන් වහන්සේගේ කරුණාව ලැබුණේය. බලව නුඹ ගර්භනීව පුත්‍රයෙකු වදන්නීය. උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. උන්වහන්සේ උතුම්ව මහෝත්මයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක. උන්වහන්සේගේ පියා වූ දාවිත්ගේ සිංහාසනය දෙවි වූ ස්වාමීන් වහන්සේ උන්වහන්සේට දෙන සේක. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරේහි සදාකාලෙටම රජකම් කරන සේක.

උන් වහන්සේගේ රාජ්‍ය කෙළවර නොවන්නේය. එවිට මරියා දේව දූතයාට කථා කොට මා පුරුෂයෙකු නොහැඳින සිටින බැවින් මේක වෙන්නේ කෙසේදැයි කීවාය. දේව දූතයා ඇයට උත්තර දෙමින් ශු. ආත්මයාණන් වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභාව ද නුඹ වසා ගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක. (ලූක් 1:26-35) එවිට කායින් ස්වාමීන් වහන්සේට කථා කොට මාගේ දඬුවම් දැරිය නොහැකි තරම් මහත්ය. බැලුව මැනව. ඔබ වහන්සේ අද දවසෙහි භූමි තලයෙන් මා එළෙවූ සේක. මමද ඔබ වහන්සේ ඉදිරියේ සැඟවෙන්නෙමි. පොළොවේ පලායන්නෙක් ද තැනින් තැන යන්නෙක් ද වෙමි. තවද මා සම්බවෙන කවරෙක් නමුත් මා මරන්නේ යයි කීය. (උත්පත්ති 4, 45, 9, 13, 14)

කායින් ආබෙල් සෙත් වෙනි අයගේ ඉපදීම ගැන බයිබලයේ සඳහන් වී ඇත. ආදම් තමාගේ භාර්යාව හැඳින්නේය. ඇය ගර්භනී වී කායින් වැදුවා ය. ස්වාමීන්ගෙන් එක් මනුෂ්‍යවත් වැදුවෙමි කීවේය. පසුව ඔහුගේ සහෝදරයාවූ ආබෙල් ව වැදුවේය. (උත්පත්ති 4:1-2)

පසුව ආදම් තමාගේ භාර්යාව හැඳින්නේය. ඇය පුත්‍රයෙක් ව වදා ඔහුට සෙත් යන නාම තැබුවාය. (උත්පත්ති 4:25) ආදම් දෙවරක් එකතුවීමේ පුත්‍රයන් තුන් දෙනෙක් ලබනවා. ස්වාමීන් වහන්සේගේ සැබෑ වූ වචනය බයිබලයේ තිබෙන බැවින් ඉහත සඳහන් දේ බොරු යැයි කිව නොහැකිය. මෙහි තේරුම පසුව ශු. ආත්මයාණන් වහන්සේම එළිදරව් කරන සේක. ආදම්ගේ ක්‍රියා දෙකක් කරගෙන පුත්‍රයන් තුන් දෙනෙක් ඉපදුනා නම් එක්කෙනෙක් ආදම්ගේ දරුවෙක් නොවෙති. සැබැව නම් සර්පයාගේ පුත්‍රයාත් (කායින්) ආදම්ගේ පුත්‍රයා අබෙල් නිවුන් දරුවන්ව එවාගේ කුසේ වැඩුනේය. ආබෙල් බිහිවෙන්නට ටිකකට කලින් කායින් එවොගේ කුසේදී වැඩුනේය. මෙය එසේ විය නොහැකියයි හිතන අය (Medical Report) කියවලා බැලිය යුතුය. මෙහිදී (Norway) දේශයේ සිටියා වූ එක්තරා ස්ත්‍රියක නිවුන් දරුවන් දෙදෙනෙක්ව බිහි කළාය. එම දරුවන්ගෙන් එක් දරුවෙක් කලු පාටටත් අනික් දරුවා සුදු පාටටත් සිටියේය. එම ස්ත්‍රියගේ ස්වාමි පුරුෂයා ඇ ගැන සැක කරමින් ඇයව දික්කසාද කළාය. ඇයට නික්ග්‍රෝ කලු ජාතික පෙම්වතෙක් සිටිය බවට ඇය විසින් පිළිගනු ලැබුවාය. එක් ගැබ් ගැනීමකට පසු නව සති තුනකින් අනිත් ගැබ් ගැනීමක් ඇයට සිදු වූ බවට වෛද්‍යවරුන් කීය. 1963 දී (Texas) නම් නගරයක (Beumont)කියන්නා වූ ස්ථානයේ සිටියා වූ එක්තරා කාන්තාවක් වෙනත් වූ ආකාරයෙන් දෙවනාවක් ගැබ් ගත්තාය. එක දරුවෙක් කුසේ සිටින විටම ඇය මැරුණාය.

සර්පයාගේ බීජ ඇයි මේ ආකරයෙන් හටගන්නේ ? මිනිසා දෙවියන් වහන්සේ උදෙසාම මවන ලද්දේය. ඔහු දෙවියන් වහන්සේගේ (ශු. ආත්මයාණන්ගේ) විවේක ගන්නා වූ ස්ථානයක්ව, මාලිගවක් මෙන් සිටිනවා. ඔහු (දාවිත් දෙවියන් වහන්සේගේ කරුණාව ලැබූ බැවින්, යාකොබ්ගේ දෙවියන් වහන්සේට තමා විසින් සාදාගෙන යාච්ඥා කළේය. නමුත් උන්වහන්සේට මාලිගාවක් ගොඩනැගුවේ සාලමෝන්ය. එසේද වුවත් අතින් සැදුවා වූ මාලිගාවල මහෝත්මයාණන් වහන්සේ වාසය නොකරන සේක. අහස මාගේ සිංහාසනයක්ද, පොළොව මාගේ පා පුටුවය. මා උදෙසා තුඹලා මොන ස්ථානයක් ගොඩනගන්නාහුය. මා විසින් වාසය කරන්නාවූ ස්ථානය කුමක්ද?. මේ සියල්ල මා විසින් සැදුවා නොවේද? යයි ස්වාමීන් වහන්සේ කියන සේක යයි අනාගත වක්තෘවරුන් විසින් පවසා ඇත. තවද කැලැල් ඇත්තෙහි, සිතින් ද කන්වලින්

චර්ම ඡේදනයෙහි නුඹලාගේ පියවරුන් වාගේ නුඹලාත් ශු. ආත්මයාණන්ට විරුද්ධව සිටිනවා. (ක්‍රියා 7:46-51) ස්වාමීන් වහන්සේ මනුෂ්‍යයා තුළ රුදෙන ආකාරයෙන් සාතන්ට ආශාවන් බිහි වුනේය. ඒ නමුත් ඒ ආකාරයෙන් සිටීමට ස්වාමීන් වහන්සේට පමණයි බලය තිබුනේ. ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ බලය කරණ කොට ගෙන මරිය තුමියගේ කුස තුළ ශරීරය නිර්මාන කොට වාසය කළේය. සාතන්ට එසේ කිරීමට බලය නැත. නමුත් මිනිස් වර්ගයා සමඟ සමබන්ධකම් පවත්වන්න ආශා කළේය. ගෙරසේනයන්ගේ රටේ ඌරු රැළට ඇතුල් වුනාක් මෙන් (ලූක් 8:33)

ඒදෙන් උයනේ කෙළින් සිටියා වූ සර්පයා තුළට ඇතුල් වී එවාට දූෂණය කරමින් ඇය තුළින් කායින්ව බිහි කළේය. සාතන්ගේ ආත්ම ගති ලක්ෂණවලින් ද සතුන්ගේ මාංශ තෘෂ්නාවද එක ආකාරයෙන් ඔහු තුළ තිබුණේය. යම් සතෙකුගේ (Thyroid Cells) මිනිසාගේ (Kidney Cells) තුළට ඇතුල්වන බව සොයාගෙන තිබෙනවා. අස්වලට නොපෙනෙන යම් බලයක් සුදුසු ස්ථානවලට සම්බන්ධ කරනවා. මේ යුගයේ සතුන් සහ මිනිසුන් එකතුවීමෙන් බෝනොවුනාට, මිනිසාටත් සතුන්ටත් තිබෙන්නා වූ මෙවැනි රසායනික සම්බන්ධනාවය ඒදෙන් උයනේදී සර්පයා සමඟ ඇති වුනා වූ සම්බන්ධතාවය ඔප්පුවෙනවා.

ඉහත සඳහන් කරුණු සියල්ල නැවත වරක් කියන්න මා බලාපොරොත්තු වෙනවා. ඒදෙන් උයනේ ගස් දෙකක් තිබුනේය. යේසුස් වහන්සේ ජීව වාක්ෂය අතින් ගස් නම්, සාතන් යනු ඔහු විසින් ලබා දුන්නා වූ එලවලින් හඳුනා ගන්න පුළුවන්.

මෙම ගස් දෙකම මිනිසාගේ ජීවිතය සමඟ සම්බන්ධ වූ බවත් ස්වාමීන් වහන්සේගේ උසස් සැලැස්ම සම්පූර්ණ වීමට මේ දෙකම හේතුවක් වූයේය. මෙය අප පිළි නොගන්නා විට දෙවියන් වහන්සේගේ සියළු දැනීම ගැනත් අපි උන් වහන්සේ සැකකරන්නා වූ සෙනගක් බවට පත් වේ. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ සදාකාල ජීවනය මිනිසාට බෙදා දීමට ලෝකය මවන්නන් පෙර කැමති වූ සේක යයි බයිබලය පවසයි. තමන් වහන්සේගේ ඉදිරියේ අපි ප්‍රේමයෙන් නිර්මලකමෙනුත් කිසි වරදක් නැත්තා වූ අයවලුන්ව සිටීමට උන්වහන්සේ අපව තෝරා ගත් ආකාරයෙන් උන් වහන්සේ තුළ තිබුනා වූ සීමාවක් රහිත වූ ප්‍රේමයෙන් අපව උන්වහන්සේගේ දරුවන් වීමට අපව උන්වහන්සේ තෝරා ගෙන තිබේ. උන්වහන්සේගේ කරුණාව කරණකොට ගෙන උන්වහන්සේගේ ලේවලින් පාපය සමාව වූ ගැළවීම ද අපට ලැබී තිබෙනවා.

එම කරුණාව සියළුම ප්‍රඥාව හා නුවණ සමඟ අප තුළ වර්ධනය කළ සේක. කාලය සම්පූර්ණ වෙන කල්හි ස්වර්ගයේ සහ පොළොවේ තිබෙන්නා වූ සියල්ල උන්වහන්සේ තුළ ගොඩ නැඟිය යුතු යයි තමන් තුළ තීරණය කළා වූ දේවල් තමන් වහන්සේගේ දයාවේ සැලැස්ම අපට එළිදරව් කළ සේක. තවද ක්‍රිස්තුස් වහන්සේ මත විශ්වාසයෙන් සිටියා වූ අපද උන්වහන්සේ මහිමයට කොටස්කරුවෙක් මෙන් ද තමන් වහන්සේගේ කැමැත්තේ යෝජනාව අනුව, අපද පෙර තෝරා ගෙන ක්‍රිස්තුස් වහන්සේ තුළ නිදහස්වන හැටියට තෝරා ගනු ලබමුව. ලෝකය පටන් ගැන්මේ සිට මරන ලද බැටළු පැටවාණන්ගේ ජීවන පොතෙහි නම් ලියවී නොතිබුණු පොළොවෙහි වසන සියල්ලලෝ ඌට නමස්කාර කරන්නෝය. (එළි 13:8) දෙවියන් වහන්සේ මාංසයෙන් එළිදරව් වීම තුළින් හැර වෙන කිසිම දෙයකින් මනුෂ්‍යයාට උන්වහන්සේගේ සදාකාල ජීවනය උරුම කර ගන්නට නොහැකි වේ. මෙයද දෙවියන් වහන්සේගේ සදාකාල ජීවනය උරුම කර ගන්න. මෙයද දෙවියන් වහන්සේගේ සදාකාල බලාපොරොත්තුවෙන් කොටසක් සහ පෙර තෝරා ගත්තාවූ (Destinated) මෙයද උන්වහන්සේගේ මිදීමේ සැලැස්ම වේ. දෙවියන් වහන්සේ, තමන් වහන්සේගේ මිදීමේ අදහස එළි දක්වන්නට, මිදීම අවශ්‍ය වූ යම් මනුෂයෙක්ව පෙර තෝරා ගැනීමට අවශ්‍යව තිබුනි. මිදීම ලබා ගැනීම තුළින්, මනුෂ්‍ය නුවණ ලබා, ඔහු මවන ලද අරමුණ කුමක්දැයි ඔහු විසින් හඳුනා ගනියි. දහස් ගණන් දේව වචනවල් විශේෂකයින් මක්නිසාද සියල්ල උන්වහන්සේ කෙරේහි උන්වහන්සේ කරණ කොට ගෙනය. උන්වහන්සේ උදෙසාය. (රෝම 11:36) යන්නා වූ දේව වචනයෙන්, ඔප්පුවේ. මනුෂ්‍යයන් රැස්ව ඒදෙන් උයනේ මැද තිබුනා වූ ජීව ගසේ කොටස්කරුවෙකු වීම අපහසුයි. සදාකාලික ගස පළමුවෙන් මනුෂ්‍යයෙක් විය යුතුය. දෙවියන් වහන්සේ මනුෂ්‍යයාව පාපයෙන් නිදහස් කරන්නට නම් පාපයෙන් සිටින්නා වූ මනුෂ්‍යාන් අවශ්‍යයි.

මාංසයේ තෘෂ්ණාවලින් මනුෂ්‍යායව පාපයට වට්ටවන්න පුළුවන් වූ එකම තැනැත්තා සාතන් පමණක්ය. පාපයට වැටුනාවූ මනුෂ්‍යාව මුදවා ගන්නා පිණිස ක්‍රිස්තුස් වහන්සේ මාංසයෙන් එළිවූ ආකාරයෙන් සාතන් මාංසයෙන් එළිදරව් විය යුතුය. නමුත් ක්‍රිස්තුස් වහන්සේ වගේ තමන්ට ශරීරයක් මවන්නට ඔහුට බැරිය. එම නිසා මනුෂ්‍යයන් ලෙස ශරීරයෙන් යුත් සර්පයා තමාගේ බීජ මනුෂ්‍යය වංශයට ඇතුල් කළ සේක. (යේසුස් වහන්සේත් ශු. ආත්මයාණන්ව මනුෂාය්‍ය තුළට ඇතුල් වී සිටිනවා.) මළවුන්ගෙන් නැගිටීමේදී මහිමයේ ශරීරයක් ලබා ගත්තේය. එදෙන් උයනේදී දෙවියන් වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ කළ සේක. දෙවියන් වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ වීමට, සාතන් සියල්ල කළායින් පසු උයනේ තිබුනා වූ ජීව වෘක්ෂය ලබා ගන්න මනුෂ්‍යයාට නොහැකි විය. මනුෂ්‍යයාට සදා කාල ජීවනය ලබා ගන්න එය සුදුසු කාලය නොවීය. මෘගයා මනුෂ්‍යාව පාපයට යොමු කළ බැවින් යම් මෘගයෙකුගේ

ලේ හැලීම තුළින් නැවත මනුෂ්‍යයා සමග සම්බන්ධ වූහ. යම් දවසක් දෙවියන් වහන්සේ මාංශයෙන් එළිදරව් වී, කුරුසියේ මරණය දක්වා තමන්ව පහත් කළ සේක. සදාකාල ජීවනයේ කොටස්කරුවෙක් විය. මෙම පැහැදීම සර්පයාගේ බීජයේ රහස් ඔබට ප්‍රත්‍යක්ෂ කර දී ඒවාල් ගෙඩිය නොකාපු බවත් ඔබට උගන්වයි.

ඒවා පාපයට වැටුනු බැවින් ඇයි ආදම්ට දෙවියන් වහන්සේ වරද තැබුවේ? යයි බොහෝ අය මාගෙන් ප්‍රශ්න කරනවා. දෙවියන් වහන්සේගේ වචනය සහ පනත් කිසි කලෙක වෙනස් නොවන්නේය. මන්ද එය මේ ලෝකය මවන්ටත් පෙර සූදානම් කර, බොහෝ කලකට පසු මෝසෙස්ට දෙනු ලබමින් බයිබලයට ඇතුල් වුනේය. ආදම් මෙම අණ පනත්වලට ඇතුලත් වී සිටියා. යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමි පුරුෂයාව අත හැර වෙනත් පුරුෂයෙක් සමග ජීවත් වන්නට පටන් ගන්නා නම් ඇය වශ්‍යය ස්ත්‍රියක් යයි බයිබලය උගන්වයි. ස්වාමි පුරුෂයාට ඇය නැවත වරක් භාර නොවිය යුතු යයි බයිබලයේ සඳහන් වේ. ඒවාව භාර ගන්නා නම් පනත් කඩකිරීම යයි දැනගෙනත් ආදාම් ඇයව භාර ගත්තේය. ඒව ආදම්ගේ කොටසක් වූ බැවින් ඇයව භාර ගත්තේය. මෙය තුළින් ඇය කලා වූ පාපය ආදාම් විසින් භාර ගනු ලැබුවේය. ආදාම් ඒවව හැඳින්නේය. එබැවින් ඇය ගර්භනී වූයේය. ඒවා කෙරෙහි තිබුණා වූ ප්‍රේමය නිසා ආදාම් මනුෂ්‍ය වර්ගයාව මුළුමනින්ම පාපයට වහල් කළේය.

ඒව ආදාම්ට ආබෙල්, සෙත් යන පුත්‍රයන් දෙදෙනෙක්ව වැදූවාය. ඔවුන් පාපයේ කැළලෙන් යුත් මනුෂ්‍ය වර්ගයාගේ මුල් වූයේය. ආදාම් පටන් සත්වෙනියා වූ ඒනොක් යයි යූදස් පවසයි. (යූද් 14) උත්පත්ති 5 පරිච්ඡේදයේ මෙසේ පවසයි. ආදාම්ගේ වංශ ඉතිහාසය 1. ආදාම්, 2. සෙත්, 3. ඒනෝස්, 4. නොත්, 5. මහලලෙල්, 6. යරේද්, 7. ඒනෝක්. නමුතේ කායින් එම වංශ ඉතිහාසයේ ඇතුලත් වී නැත. ආදාම්ගේ වංශය සෙත් තුළින් පැමිණෙන්නේය. කායින් ආදාම්ගේ පුත්‍රයා නම් කායින් තුළින් පරම්පරාවක් බිහිවය යුතුයි. ආදාම් වයස අවුරුදු 130 දී තමාගේම සමානත්වයෙන් තමාගේ ස්වරූපය මෙන් පුත්‍රයෙකු උපදවා ඔහුට සෙත් යන නම තැබුවේය. (උත්පත්ති 5:3) යයි  බයිබලය උගන්වයි. කායින් ආදාම්ගේ ස්වරූපයට සමානව සිටිය බවට බයිබලයේ කිසිම තැනක සඳහන් වී නොමැත. කායින් ආදාම්ගේ පුත්‍රයා නම් ඔහුගේ ස්වරූපය තිබිය යුතුය. එපමණක් නොව ලූක් සුභාරංචි පොතේ සඳහන් පෙළපොතේ කායින්ගේ නම සඳහන් වී නොමැත. ``ඔහු ඒනෝන් ගේ පුත්‍රයාය. ඔහු සෙත්ගේ පුත්‍රයාය. ඔහු ආදාම්ගේ පුත්‍රයාය. ඔහු දෙවියන් වහන්සේගේ පුත්‍රයාය`` (ලූක් 3:38) යනුවෙන් සඳහන් වී ඇත.

කායින්ගේ වංශය දෙවියන් වහන්සේට විරුද්ධ වූ අය බවත් සෙත්ගේ වංශය දෙවියන් වහන්සේට භයව සිටියාවූ වංශය බව බයිබල් ශිෂ්‍යයන් දැන සිටිතවාතම්, ඔවුන් විසින් කල්පනා කර නොමැත. සෑම පරම්පරාවක්ම දෙවියන් වහන්සේත් ආදාම් වෙත බැවින්, කායින් ආදාම්ගේ පුත්‍රයාණන් ඔහුද අධික දේව භක්තියෙන් සිටින්නට තිබුණේය. නමුත් කායින් සියලු මිනිසුන්ටත් වඩා දුෂ්ටවත්ව, දෙවියන් වහන්සේවත් උන් වහන්සේගේ අණ පනත්වලට විරුද්ධව සිටිය බවයි බයිබලයේ අප දැන ගන්නේ.

බයිබලය අවශ්‍ය නොමැතිව වචනය භාවිතා නොකරයි. සෑම වචනයකම තේරුම අභිෂේක ලත් අය දැන ගනියි. ``ආදාම් තමාගේ භාර්යාවට ඒව යන නම තැබිය. මක්නිසාද, ඇය ජීවමානව සිටන්නා වූ සියලු දෙනාටම මවක් බව ලියා තිබේ. ආදාම් ජීවමාන සියල්ලන්ට පියා බව බයිබලයේ කොහේවත් සඳහන් වී නොමැත.

මිනිසුන් අචේතනික (Unconsciously) සර්පයන් විසින් වශී කරන බවත්, මෙය මාංශ තෘෂ්නාවල්වලට සම්බන්ධ (Sexul) යයි මානසික වෛද්‍යවරු සඳහන් කර තිබේ. මෙය 1963 මාර්තු 2 වෙනිදා Life නමැති සඟරාවේ සඳහන් කර තිබේ. (Tribe) ගෝත්‍රිකයන් අද කාලයේත් සර්පයාව ලිංගිකව සම්බන්ධ කර ගනිමින් නමස්කාර කරන බව සඳහන් ය. නූගත් වූ ඔවුන් කෙසේද ඒ දේව උයනේ සිදු වුණා වූ දේවල් දන්නේ ?

හෝවාගේ කාලයේ සිදු වුණාවූ ගංවතුර පිළිබඳ අද කාලයේ සියලු දෙනා ම දැන ගන්නා වූ ආකාරයෙන් මිනිස් වර්ගයා පාපයට වැටුණා වූ සැබෑව සෑම තැනහේම දැන ගනියි.

සර්යා පිළිබඳ ඒව අවදිව සිටියයුතුය. එසේ නොවෙයි නම් ඔහු දූෂණය කරාවි යයි දෙවියන් වහන්සේ පැවසුවාදැයි ඔබ විසින් ප්‍රශ්න කළ හැක. මින් පසු සිදු වන්නට යන්නා වූ සිදුවීම් පිළිබඳ කල් ඇතුව දන්වන්නට අවශ්‍ය නැත. නුවණේ කොටස් කරුවෙක් නොවන්න. ජීවනයේ කොටස්කරුවෙක් වන්න යයි දෙවියන් වහන්සේ පැවසුවේය. දෙවියන් වහන්සේගේ වචනයමයි ජීවනය. දෙවියන් වහන්සේගේ වචන නොමැති සියල්ල මරණය වේ. ඒව එක වචනයක් පමණක් වෙනස් කිරීමට අවසර දුන් නිසා සාතාන් ඇයව ජය ජය ගන්නා. ව්‍යවස්ථාවේ එකක් කඩ කලොත් මුළු ව්‍යවස්ථාවම කඩකලා යයි ගණන් ගනු ලැබේ.

යහපත හා නපුර දැන ගැනීමේ ගහ මරණය ගෙනාවේය. කයින් තමාගේ සහෝදරයා වූ ආබෙල්ව මැරුවේය. එදා පටන් ධර්මිෂ්ටයන්ව අපට පීඩා කරන්නන්

මරන්නත පටන් ගත්තේය. අනාගත වක්තෘන් විසින් කියන ලද්දා වූ ``මිදීම දවස`` (Restoration Periad) දක්වා සිදු වන්නේය.

යහපත හා නපුර දැන ගැනීම් ගහ, ප්‍රඥාවන්තයන්වත් ප්‍රසිද්ධ ලද්දාවූ මනුෂ්‍යත්ව ලෝකෙට ලබා දුන්නේය. ඔවුන් මාර්ගවල් සියල්ල මරණයේ මාර්ග වූයේය. දෙවියන් වහන්සේගේ මිනිසුන් සාමාන්‍ය අයවලුන්ය. ඔවුන් ආත්මික බීජ දරමින් දෙවියන් වහන්සේව අදහාගෙන, සාමාන්‍ය ජීවිකාව කරමින්, පොහොසත්කමට වඩා සත්‍යයට ඇලුම්ව ජීවත් වෙයි. සර්පයාගේ බීජ මහත් වෙළඳාම්, බොහෝ අලුත් දේවල් සෙවීමට (Inavenation) හේතුවක් වූයේය. ඒ සමඟ මරණයත් හට ගත්තේය. සොයා ගත්තා වූ පතරොම් පරමාණු බෝම්බවල් යුද්ධ කාලවලදී ඔවුන් විසින් සොයා ගන්නා ලද මෝටර් රිය එම කාලවලටත් වඩා මිනිසුන්ව බිලිගත්තේය. මරණයක් විනාශයක් ඔවුන්ගේ ක්‍රියාවේ ප්‍රතිඵලයක් වූයේය.

නමුත් සර්පයාගේ වංශසයෙන් භක්තිවන්තයන්ව සිටිය හැක. කායින් සහ සාතාන් දෙවියන් වහන්සේව විශ්වාස කළ ආකාරයට ඔවුන්ද දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් සිටියි. ඔවුන් දේවස්ථානවලට ගොස් කිරිගු අතරේ කිරිදි වැඩෙන්නාක් මෙන් ධර්මිෂ්ඨයන් සමග සම්බන්ධ වී නිකොලෝ ආගම බිහි කරයි. කායින් ආබේල්ව මරපු ආකාරයෙන් මොවුන්ද දෙවියන් වහන්සේගේ බීජ විනාශ කරන පිණිස විප බීජ ඔවුන් අතරට පතුරුවයි. දෙවියන් වහන්සේ උන් වහන්සේට අයිති කිසි කෙනෙක්ව නැති කර ගන්නේ නැත. මරණය දක්වාම ඔවුන්ව රැක ගනිමින් අවසාන කාලයේ ඔවුන් ව නැගිටවන බව පවසා ඇත.

පාපයට වැටුණු බැවින් ආදාම් හට නොලැබුණා වූ ඒදෙන් උයනේ ජීව ගස ජය ගන්නට ලැබෙනවා ඇත.

ජීව ගහ ආරක්ෂා කළා වූ කේරුබ්ගේ ආලෝක විහිදෙන කඩුව බැටළු පැටියාගේ ලේ පැල්ලම් කරණකොටගෙන කොපුවට දමනු ලද්දේය. ආදාම්ටත් ඔහුගේ වංශයටත් නොලැබූ ජීව ගස දැන් ජය ගන්නාට ලැබෙන කාරණය ගැන ටිකක් බලමු.

මිනිසා තමන්ගේ ජීවිතයේ දෙවියන් වහන්සේගේ වචනය එළිදරව් කිරීමයි උන් වහන්සේගේ කැමැත්ත වූ සේක. ආදාම් සෑම වචනයකටම අනුව ජීවත් වීමට දෙවියන් වහන්සේ අණ කළ විට, ඔහු එසේ කරන්න අසමත් වූණි. පැමිණෙන්න යන්නා වූ උතුම් වූ ආනාගත වක්තෘට සලකුණක් වූ මෝසෙස් තුමාගේ කෝපය කරණකොට ගෙන දෙවියන් වහන්සේගේ වචනයට කීකරු වීමට අසමත් වූහ. ස්වාමීන් වහන්සේගේ

සිතට ගැලපෙන්නා වූ දාවිත් රජ තුමාත් පරික්ෂා කරන විට වේශ්‍යකම් කරමින් දෙවියන් වහන්සේගේ වචනය අනුව ජීවත් වන්නට අසමත් වූයේය.

කාලය සම්පූර්ණ වූ කල යේසුස් වහන්සේ ආ සේක. දෙවියන් වහන්සේගේ මුඛයේ සිට පැමිණෙන්නාවූ සෑම වචනයක් කරණකොට ගෙන ජීවත් වේ යයි පරික්ෂා කරනු ලැබුවාය. එම පරික්ෂා වෙන් උන් වහන්සේ ජය ගනිමින්, සාතාන්ව පරාජයට පත් කරනු ලැබුවාය. දෙවියන් වහන්සේගේ වචනය අනුව ජීවත් වෙමින් සියල්ල ජය ගත්තාය. දේවත්වයෙන් සම්පූර්ණයෙන් සිටියා වූ එතුමා දෙවියන් වහන්සේගේ කැළැල් රහිත බැටළු පැටියෙකු මෙන් කැළැල් රහිතව පූජා ලබමින් කුරුසියේ මරණයට පාවා දෙනු ලැබුවේය. ජීව ගසේ ගෙඩිය අපි කමින්, මිල කල නොහැකි වූ එම සදා කාල ජීවන තුලින් ජයගෙන දෙවියන් වහන්සේගේ වචනය අපගේ ජීවිතය තුලින් ප්‍රකාශ කරමින් උන්වහන්සේ කුරුසියේදී මරණයක තුවාලය ලැබුවාය.

උන්වහන්සේ කරණ කොට ගෙන සම්පූර්ණයෙන් ජය ගත්තා වූ දේව දරුවන්ට දෙවියන් වහන්සේගේ පාරාදීසයත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ නිතරම සහභාගි වෙන්නාවූ භාග්‍යද ලැබේවා. උන් වහන්සේ කිසි කලෙක වෙන් නොවන්නේය. උන්වහන්සේ කොහේ ගියත් උන්වහන්සේ සමඟ මනමාලිත් යන සේක. උන්වහන්සේ ඇති සියල්ල ඇය සමඟ බෙදා ගනිමින් මේ දක්වා සැඟවී තිබුනා වූ සියල්ල ඇයට එළිදරව්වන්නේය. උන්වහන්සේ සිටින ආකාරයෙන්ම අපි ද සිටින්නෙමු. බැටළු පැටියාගේ ලේවලිනුත් යේසුස් වහන්සේ පිළිබඳ සාක්ෂියේ වචනවලිනුත් ජය ගත්තා වූ අයට මේ සියල්ල දෙනු ලබන්නේය.

ඇද පාරවල් කෙලින් කරමින් අපි උන්වහන්සේ සමඟ සදා කාලයෙන්ම ජීවත් වන්නා වූ දවස දකින පිණිස කොයි තරමට ආශා කරමුද එම දවස ඉක්මණින් එන සේක. අපිත් උන්වහන්සේගේ වචනයට කීකරු වීමට ඉක්මන් වී උන්වහන්සේගේ මහිමය දකින පිණිස ඉක්මන් වෙමුව.

ආත්මයාණන් වහන්සේ සභාවලට කියන දේ කන් ඇත්තේ අසත්වා. පළමු සභාව ආත්මයාණන් කියපු දේ ඇසුවේ නැත. ඒ වෙනුවට මනුෂ්‍යයන් ගේ කිම අසමින් එය පිළිගත්තේය. අවසාන කාලය වන මේ කාලයේ සැබෑ වූ මනමාලි නැගිට, ආත්මයානන්ගේ හඬට කීකරු වන්නේය. දෙවියන් වහන්සේට ස්තුති වේවා. මෙම අන්ධකාර දවසේදී ශුද්ධ වචනය තුලින් ආලෝකය නැවත බබලවමින් අපිත් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව පෙර මග ගොස් පිළිගන්නා පිණිස පෙන්තකොස්ත බලය නැවත ලබාගනිමු.

TRACK - 1

S.டேனியல் சம்பத் குமார்
எண் 147, திருநிலை காலனி,
விச்சூர் போஸ்ட்,
சென்னை–600 103




for books contact :

S.DANIEL SAMPATH KUMAR
No. 147, Thirunilai colony ,
vichoor post , chennai - 600 103
E-Mail : sdanielsampathkumar@gmail.com
Website : danielendtimebooksministry.org
Phone No : 99419 74213 , 96001 71260